**සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සංරචක II - 2021**

---

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සංරචක **II** 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2018 ජූලි 25 දින එළඹි අංක 6228 LK දරන ණය ගිවිසුමේ 5.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

---

ණය ගිවිසුම අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තාක්ෂණික සහාය යන සංරචක දෙකක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.
ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 449,645 කට සමාන වූ එජඩො මිලියන 2,900 වන අතර ඉන් රු. මිලියන 15,505 කට සමාන වූ එජඩො මිලියන 100 ක් මූල්‍යයනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 434,140ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපෙරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2018 අගෝස්තු 30 දින ආරම්භ කරන ලද අතර, 2024 ජූනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර ඇත.

## 1.3 මතය

---

2021 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 52 වන කොටස. | 2021 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ දර්ශක (DLI) අත්පත් කර ගැනීම පිළිබඳ තෙවන පාර්ශවීය වලංගු කරණ වාර්තාව 2022 පෙබරවාරි 28 දිනට පෙර ලෝක බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2021 වර්ෂය සඳහා ස්වාධීන සහ අධ්‍යාපන විශේෂඥයින්ගෙන් සමන්විත තෙවන පාර්ශවීය ස්වාධීන ආයතනයක් 2022 ජුනි 30 වන විටත් පත් කර නොතිබුණි. | තුන්වන පාර්ශ්ව වලංගුකරණය (TPV) සිදු කරනුයේ අදාළ මූල්‍ය වර්ෂයේ දර්ශක (DLIs) වල සාධනය මැනීමටය. කෙසේ වෙතත්, TPV වාර්තා ලෝක බැංකුවට ඉදිරිපත් කිරීමෙන් පසු 2020 DLI සඳහා වෙන් කළ මුදල් අදාළ වර්ෂයේ (2021) ආපසු ලබා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශයට හැකි විය. | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ ඇති උපදෙස් අනුගමනය කළ යුතු බව. |
| (ආ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 ඡේදය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 5.1 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා එක් මෙහෙයුම් කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරියේදී ජාතික මට්ටමේ මෙහෙයුම් කමිටුව සැලසුම් කර ඇති පරිදි පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | චක්‍රලේඛය සහ මෙහෙයුම් අත්පොතේ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතු බව. |
| (ඇ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 96 ජේදය | අභ්‍යන්තර විගණනය අවශ්‍යතාවයන්ට අනුකූලව සිදු කර නොතිබුණි. | පිළිගනිමි. | අභ්‍යන්තර විගණනයක් කිරීමට කටයුතු කළ යුතු බව. |

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2021 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය | | |
| | | ප්‍රතිශතය | ප්‍රතිශතය | | |
| සංරචක 11 | සාමාන්‍ය පෙළ විභාග මධ්‍යස්ථාන සකස් කිරීම | 100 | විගණනය සඳහා ඉදිරිපත් කර නැත | සංරචක 1 හි දර්ශකය 09 (DLI 09) යටතේ covid-19 සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත රුපියල් මිලියන 13.4 ක මුදලක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත ලබා දී ඇති ඉහත ප්‍රතිපාදන සම්බන්ධයෙන් ප්‍රමාණවත් භෞතික හා මූල්‍ය ප්‍රගතිය අමාත්‍යාංශය විසින් ලබාගෙන නොතිබුණි. | පළාත් වලට ලබා දී ඇති මුදල් සම්බන්ධයෙන් භෞතික හා මූල්‍ය ප්‍රගතිය අමාත්‍යාංශය විසින් ලබාගෙන නොතිබුණි |

**කළමනාකාරීත්වයේ ප්‍රතිචාර** දැනටමත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවලට ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙස කිහිප වතාවක්ම දන්වා ඇත. කෙසේ වෙතත්, මෙම කටයුතුවල ප්‍රගතිය ඉදිරියේදී ලබා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

**විගණකගේ නිර්දේශයන්** භාවිතා කළ අරමුදල් පිළිබඳ සාක්ෂි ලබා ගැනීමට කටයුතු කළ යුතු බව

3.2 පද්ධති හා පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයට අනුව, 2021 දෙසැම්බර් 31 වන විට දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය රුපියල් මිලියන 4ක් විය. ව්‍යාපෘතිය නිසි ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උපලේඛන පවත්වා ගෙන නොතිබූ බැවින්, එම ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය. | වත්කම් ලේඛනය සකස් කරමින් පවතින අතර සතියක කාලයක් ඇතුළත රජයේ විගණන ශාඛාව වෙත ඉදිරිපත් කරමි. | ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උපලේඛන නිසි ලෙස පවත්වාගෙන යා යුතු බව |